


# ඔබේ දරුවා සහ VCE විභාගය

නලිනි දේවේන්ද්‍ර

ගණිතය විෂයයන් තෝරා ගන්නේ කොහොමද?

''ගණන් ඉලක්කම් අතරින් VCE විභාගයට ලිපි පෙළේ අවසාන ලිපියයි මේ. ඉතාමත්ම වැදගත් කරුණු රැසක් පාඨක ඔබට ඉදිරිපත් කරමින් නලිනි දේවේන්ද්‍ර ගණිතාචාර්යවරිය දැක්වූ අදහස්වලට අමතරව ලිපි පෙළ කියැවූ බොහෝදෙනාට ඇතිවුණ ගැටළුවක් පිළිබඳවයි මෙවර ලිපියෙන් සාකච්ඡා වෙන්නේ.

VCE විභාගයට නියමිත ගණිතය විෂයයන් මොනවාද, ඒවා නිවැරදිව තෝරා ගන්නේ කොහොමද කියන එකයි ගැටළුව. ඇතැම් කරුණු මුල් ලිපිවල ලියැවුණාත්, නලිනි ගැටළුවට අදාළ කරුණු මුල සිටම පෙළගන්වන්නට උනන්දු වුණා.

VCE විභාගයට නියමිත ගණිතය විෂයයන් තුනක් තිබෙනවා. Further Mathematics, Mathematical Methods iy Specialist Methematics.

මේ තුනෙන් පහසුම ගණිතය විෂයය Further Maths මේ විෂයය හැදෑරීමට ගණිතයට ඉතා දක්ෂ විය යුතුම නැහැ. අංක ගණිතය, සරළ වීජ ගණිතය සහ ජ්‍යාමිතියත්, සරළ ත්‍රිකෝණමිතියත් (ත්‍රිකෝණ විසඳීම ඇතුළුව) ව්‍යාපාර කටයුතු සම්බන්ධ ගණිතයත් (පොලී ගණනය කිරීම ආදිය) ඊට අමතරව සංඛ්‍යානයත් (Statistics) මෙම විෂයයෙහි අන්තර් ගත වෙනවා.

10 වන ශ්‍රේණිය සමත් වනවිට ගණිතයට සාමාන්‍ය ලකුණු ප්‍රමාණයක් (40% - 60%) ලබා ගන්නා දරුවන්ට ඉතා යෝග්‍ය විෂයයක් Further Mathematics.

Mathematical Methods විෂයය ගැඹුරු ගණිත සිද්ධාන්ත සහ එම සිද්ධාන්ත යොදා ගැටළු විසඳීම අන්තර්ගත විෂයයක්.

ලංකාවේ උසස් පෙළ ශුද්ධ ගණිතය විෂයයෙහි අඩංගු වීජ ගණිතය කලනය ඛණ්ඩාංක ජ්‍යාමිතිය සහ ත්‍රිකෝණමිතිය යන ඒකක වලින් සෑහෙන ප්‍රමාණයක් මෙහි අන්තර් ගත වෙනවා. එයට අමතරව ලංකාවේ ශුද්ධ ගණිතය පාඨමාලාවට අයත් නොවන සම්භාවිතාව ඒකකයකුත් (සංකරණ/සංයෝජන ආදියත් ඇතුළත්) මෙහි අන්තර්ගත වෙනවා. ලංකාවේ ශුද්ධ ගණිත පාඨමාලාවේ තරම් සිද්ධාන්ත ගැඹුරට ඉගැන්වීමක් මෙහිදී නොකෙරුණත්, මේ හැම සිද්ධාන්තයම උපයෝගී කරගෙන ප්‍රායෝගික හා පාරිසරික ගැටළු විසඳීම මෙම විෂයයට ඇතුළත් වෙනවා.

7-10 දක්වා ගණිතයට අඩුම තරමින් 80% ක් ලබන, ගණිතය විෂයයට දක්ෂකමක් සහ ආශාවක් දක්වන දරුවන් මෙම විෂයය තෝරා ගැනීම සුදුසුයි. මෙහිදී ගණිත කර්ම සහ ගණිත ක්‍රම පිළිබඳව දක්ෂතාවයක් තිබීම පමණක් ප්‍රමාණවත් නැහැ. සංකීර්ණව සහ තර්කාණුකූලව සිතීමේ ශක්තියත් ගැටළු විසඳීමට ඇති හැකියාවත් ප්‍රමාණවත් තරමට වර්ධනය වී තිබිය යුතුයි. ඒ වගේම තමන්ට නුපුරුදු සංකීර්ණ ගණිත සංකල්ප ඉගෙන ගැනීමට අවශ්‍ය වන ඉවසීමත් අත්‍යවශ්‍යමයි.

බොත්තමක් එබූ සැණකින් තමන්ට අවශ්‍ය සියලුදේම වගේ ලබා ගන්නට පුළුවන්කම තිබෙන යුගයක ජීවත් වන මේ දරුවන් සංකීර්ණ ගණිත සංකල්පයක් හරියාකාරව ඉගෙන ගන්නට නම් ඉවසීමත් කැපවීමත් අත්‍යාවශ්‍යයයි කියන එක දන්නේම නෑ. ගුරුවරයා කියන්නට හදන දේ එකපාරම තේරුම් ගන්නට බැරිවුණොත් එතනින් එහාට යන්නට සූදානම් නැති දරුවන්ට මේ විෂයය සුදුසු වන්නේ නෑ. 10 වන ශ්‍රේණියේ

## දෙමව්පියන්ගේ වගකීම

විභාගවලට ගණිතයට 90% වැඩියෙන් ලබන සමහර දරුවන් පවා 11 වන ශ්‍රේණියේදී ඒඑයි එඑයදි විෂයය හදාරන්නේ අමාරුවෙන්. එක පාසැල් කාලපරිච්ඡේදයක දී උගන්වන දේ අමතක වන්නට කලින් ඒ කොටසට අදාළ අභ්‍යාස සම්පූර්ණ කිරීම ඉතාමත්ම අවශ්‍යයි. ඊළඟ පාඩමේදී ඉගැන්වෙන දේ හරියට තේරුම් ගන්නට නම් ගෙදර අභ්‍යාස වැඩ සඳහා කාලය කැප කළ යුතුයි කියන එක වටහා ගැනීම ඉතාමත් වැදගත්.

Maths Methods විෂයයය තෝරා ගත යුත්තේ මේ විෂයයේ ඇති සංකීර්ණ බව අවබෝධ කරගෙන, ඒ සඳහා අවශ්‍ය තරමට කාලය යෙදවීමට සූදානම් දරුවන් පමණයි.

ගණිත විෂයයන් තුනෙන් අමාරුම විෂයය වන Specialist Maths විෂයය හැදෑරීමට ගණිතයට විශේෂිත වූ දක්ෂතාවයක් තිබිය යුතුමයි.

ලංකාවේ උසස් පෙළ ශුද්ධ ගණිතයේ සහ ව්‍යවහාරික ගණිතයේ ඇති බොහෝ සිද්ධාන්ත මෙම විෂයයට ඇතුළත් වෙනවා. මා මීට පෙරත් කියා ඇති දේම මම නැවතත් කියන්නම්. සිද්ධාන්ත ගැඹුරට ඉගැන්වීමත් මෙහිදී නොකෙරුණාට, මේ ගණිත සංකල්ප ආශ්‍රයෙන් ප්‍රායෝගික සහ පාරිසරික ගැටළු විසඳීම ඉතාමත්ම රසවත් විදිහට මෙම විෂයයෙහිදී ඉගැන්වෙනවා.

සංකීර්ණ ගණිත ගැටළු විසඳීමෙන් සතුටුවීමට, තෘප්තියක් ලබා ගැනීමට කැමති දරුවන් Specialist Mathematics උද්‍යෝගයෙන් හදාරන හැටි මා දැක තිබෙනවා. මේ විෂයය සාර්ථකව හැදෑරීමට හැකිවන්නේ ගණිතයට දක්ෂකමත්, ගැටළු විසඳා සතුටුවීමට ආශාවත් ඇති දරුවන්ටයි.

11 වන ශ්‍රේණියේදී තෝරාගත යුතු ගණිත විෂයයන් තීරණය කිරීමට පෙර කරුණු කීපයක් සලකා බැලිය යුතුයි. දරුවා යොමුවීමට බලාපොරොත්තු වන විශ්වවිද්‍යාලයීය අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඇති පාඨමාලා සඳහා මූලික සුදුසුකම් හැටියට අවශ්‍ය වන්නේ කුමන ගණිත විෂයයද කියන එක පළමුවෙන්ම සොයා ගත යුතුයි. ඊළඟට ඒ විෂයයක් හැදෑරීමට දරුවාට ඇති හැකියාව පිළිබඳව දරුවාගෙන් සහ ගුරුවරුන්ගෙන් විමසා බැලීම වැදගත්.

නලිනි පැහැදිලි කිරීම අවසානයේ අවධාරණය කළා. දරුවාගේත් ගුරුවරුන් ගෙන් අදහස් දැන ගැනීම ඉතාමත් ම වැදගත් බව මෙම සාකච්ඡාමාලාව පුරාවට නලිනි නැවත නැවතත් සිහිපත් කළා. අප

පසුගිය වර ලිපියේදීත් සටහන තැබුවා වගේම මේ ලිපිය කියවන ඔබ, දරුවන්වත් දැනුවත් කිරීම වැදගත් වෙනවා. ඒ බොහෙ-ර්විට දරුවන් මේ ලිපි නොකියවන නිසා.

මොනවා වුණත් නලිනි මෙවර ''සන්නස''ට සමු දුන්නේ මෙම ලිපි පෙළට ''නැවතුම් තිත'' තියමින්.

''මම හිතන්නේ අපි කියන්න ඕන බොහොම දේවල් සාකච්ඡා කළා. ඒ දේවල් ආයේ ආයේ ලියන එකත් තේරුමක් නෑනේ. මොනවා හරි ප්‍රශ්න තියනවා නම් අපි හෙමින් සැරේ ඉස්සරහදී කතා කරමු.'' නලිනි සිනාසෙමින් කිව්වා.


මේ ලිපිය සම්පාදනය කෙරුණේ දුම්රියේදී. අප අසළින් වාඩි වී සිටි සුදු මහත්මයෙකු හඬ අවදි කළා.

''නුඹ ශ්‍රී ලංකාවෙන්ද? මට තේරෙනවා නුඹ කරන දේ.'' ඉංග්‍රීසියෙන් ලියවුණ වචන දිහා බලමින් ඔහු කීවා. ''හරිම වැදගත් වැඩක්''

ඒ වචනවලට අප ස්තුතිවන්ත වෙන්න ඕන. නලිනි දේවේන්ද්‍ර ගණිතාචාර්යවරියට ලිපි පෙළ ආරම්භයේදී අප ලියූ සේම අප බොහෝ දෙනෙකු දරුවන් කැටිව මෙරටට සංක්‍රමණය වුණේ දරුවන්ගේ ඇස් පාදා දෙන්න. දරුවන්ගේ ඇස් පාදා දෙන්නට කලින් දෙමව්පියන්ගේ ඇස් පාදාදීම වැදගත්. ඒ දේ හැමෝටම කරන්නට පුළුවන්ද? විෂය දැනුම, ඉගැන්වීමේ පළපුරුද්දට අමතරව මෙරට පරිසරය, ඉගැන්වීමේ ක්‍රම පිළිබඳ අවබෝධය මෙහිදී ඉතා වැදගත් වෙනවා. මේ සියලු දේ මුහු කරලා සිංහල පාඨකයින්ට වැටහෙන ලෙසින් කරුණු දැක්වීමට හැකි ආචාර්යවරියක් අප අතර සිටීම වාසනාවක් නොවේද? ඉතින් ''සන්නස'' පාඨකයින් වෙනුවෙන් අපගේ හෘදයාංගම ස්තූතිය නලිනිට පිරිනමමින් ඇයගෙන් සමුගත්තා.

ලිපි පෙළ මුල සිටම කියැවීමට නොහැකි වූවන් වෙනුවෙන් යමක් සිහිපත් කරන්නට මෙම ලිපිය නිමාවට පෙර ඉඩක් ලබා ගන්නවා. පසුගිය ලිපි ඔබට www.sannasa.net වෙබ් අඩවිය තුළින් කියැවිය හැකියි. ඒ ඒ ලිපි හා කලාපයේ මාසයත්, පිටු අංකත් සටහන් කරනවා නම් 2006 දෙසැම්බර් 35 පිට, 2007 ජනවාරි 38 පිට, අප්‍රේල් 33 පිට, මැයි 33 පිට සහ ජුනි 33 පිට ඔබගේ ගැටළු වෙතොත් ''සන්නස'' වෙත යොමු කරන මෙන් ආරාධනයක්ද කරමින් මෙම ලිපිපෙළ මෙලෙස නිමාව දකිනවා.

**සාකච්ඡා කළේ. සිසිර දිසානායක**




**තේරවිල්ල - තේරුම**

අන්නාසි





W.L. PARKER AND ASSOCIATES PTY. LTD
Registered Tax Agent & Accounting, Business & taxation Services

14 DAY TAX REFUNDS

INDIVIDUAL RETURNS
$60

ON SITE CONSULTATION AVAILABLE

CONTACT KASUN GAMLATH
0430138283

Email: kasun@wlparker.com.au
***************